# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/65 – 2022 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා – 2022.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/02/2014.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2022.01.19 වන දින අංක 2263/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.01.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. එස්. එම්. විජේසිංහ මයා, වැත්තෑව පාසල ඉදිරිපිට, වැත්තෑව , දඹදෙණිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, අංක 106, යටිනුවර වීදිය, මහනුවර.

අතර පවත්නා 2022.01.07 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජනරංජනී සුමිත් අමරසිරි මිය වෙත යොමු කරන ලදී.

1A – G 37784 – 09 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු නීතිඥ ජනරංජනී සුමිත් අමරසිරි මිය ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.01.10 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.
EOG 10 - 0128/1

---

මගේ අංකය: IR/22/02/2014.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. එස්. එම්. විජේසිංහ මයා, වැත්තෑව පාසල ඉදිරිපිට, වැත්තෑව , දඹදෙණිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, අංක 106, යටිනුවර වීදිය, මහනුවර.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැප්පෙටිපොල, කළුබුලුලන්දල, වියාල කුඹුර, නීතීඥ එල්. ඒ. එම්. නිමල් අබේසිංහ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/02/2014.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. එස්. එම්. විජේසිංහ මයා, වැත්තෑව පාසල ඉදිරිපිට, වැත්තෑව , දඹදෙණිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, අංක 106, යටිනුවර වීදිය, මහනුවර.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. හි සේවය කළ ඩී. එස්. එම්. විජේසිංහ නැමති සේවක මහතාට 2012.04.01 දින සිට 2013.03.31 දින දක්වා සහ 2013.04.01 දින සිට 2014.03.31 දින දක්වා කාලයන්ට අදාල වාර්ෂික වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා හා ලාභ කොටස් තමාට ලබා නොදීමෙන් අසාධාරණයක් වූ බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0128/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.